# දිඹුලාගල ප්‍රාදේශීය සභාව
# පොළොන්නරුව දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 16 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 22 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය.

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මිරිදිය මාළු විකිණීමට අදාල වෙළඳ අයිතිය බදු දීමේ ගාස්තු රු. 583,300 ක්, මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැර තිබුණි.

(ආ) සභාවට අයත් සුසාන භූමි 58 ක වටිනාකම් ගණනය කර,, මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා නොතිබුණි.

(ඇ) මහවැලි සංවර්ධන අධිකාරිය සතු සිරිපුර ජල යෝජනා ක්‍රමය, නුවරගල ජල යෝජනා ක්‍රමය හා වෙහෙරගල ජල යෝජනා ක්‍රමවලට අයත් ඉඩම්, ජල පොම්පාගාර ඇතුළු අනෙකුත් උපකරණ සභාවට පවරාගෙන තිබුණු නමුත්, ඒවායේ වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 දෙසැම්බර් 31 වන විට විගණන විමසුම් 2 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු. 30,000 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 30.221,373 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 10,008,833 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 3,303,858 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය.**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්.**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට වු සම්චිත හිගය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 2,016 | 1,568 | 1,091 |
| (ii) | බදු කුලී | 129 | 50 | 200 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 484 | 485 | 335 |
| (iv) | වෙනත් ආදායම් | 25,598 | 30,768 | 7,343 |

**2.2.2 උසාවි දඩ**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ මුදල රු. 4,895,268 ක් විය.

## 2.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

පහත විග්‍රහ කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | නිශ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|
| (i) | තණකොළ කපන යන්ත්‍රය | කාලය නිශ්චිත නැත |
| (ii) | යතුරු පැදිය | අවුරුදු 06 |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

(අ) සමාලෝචිත වර්ෂයේදී ආදායම් ණයගැතියෝ රු. 106,062 ක් සහ ණය හිමියෝ රු. 669,654 ක් සමුච්චිත අරමුදලින් කපා හැර තිබුණද 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වන වගන්තිය ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තියේ විධිවිධාන අනුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොලබා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 01 දින දිඹුලාගල බල ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ පැවති සුහද හමුවක් සඳහා සංග්‍රහ වියදම් රු. 73,500 ක් ද ඇතුළුව රු. 151,597 ක වියදමක් දරා තිබුණි.

(ඇ) උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන අමාත්‍යවරයාගේ 2009 දෙසැම්බර් 19 දින අංක 1528/21 දරණ ගැසට් නිවේදනය අනුව සභාපතිවරුන්ට එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් සංයුක්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් සඳහා මසකට අනුමත ඉන්ධන ඩීසල් ලීටර් 400 සීමාව ඉක්මවා, සමාලෝචිත වර්ෂය තුළදී ඩීසල් ලීටර් 1158 ක් සඳහා රු. 91,855 ක වියදමක්, සභා අරමුදලෙන් දරා තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට මාසිකව රු. 1,000 ක සංග්‍රහ දීමනාවක් සහ එක් මහ සභා රැස්වීමක් සඳහා සභා අරමුදලින් එක් සභිකයෙකුට දැරිය හැකි සංග්‍රහ වියදම් දීමනාව රු. 50 සීමාව ඉක්මවා, සමාලෝචිත වර්ෂය තුළදී රු. 11,447 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

## 2.5 කොන්ත්‍රාත් පරිපාලනය

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 හා 2011 සැප්තැම්බර් 27 දිනැති අංක 452 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ නියමයන් අනුව අනුමත සමිතියක් සඳහා කොන්ත්‍රාත්තුවක් පිරිනැමීමේදී කිසියම් නිශ්චිත කාලයක් තුළ එම සමිතිය විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව 03 කට නොවැඩි විය යුතු අතර දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්තුවල ඉතිරි කොටස්වල මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකම් යන දෙකෙහි එකතුව රුපියල් මිලියන 02 ක් නොඉක්මවිය යුතු වුවත්, එම විධි විධානවලට පටහැනිව ගොවි සංවිධාන 3 කට එකතු වටිනාකම රු. 11,996,005 ක් වූ කොන්ත්‍රාත්තු 29 ක් පිරිනමා තිබුණි.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

සභාවට පැවරී ඇති කාර්යයන්, ඉදිරි වර්ෂවලදී ඉටුකිරීමට සැලසුම් කර ඇති ආකාරය දැක්වෙන, සංයුක්ත සැලැස්මක් හා සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.7 අභ්‍යන්තර විගණනය.

-----------------------

සමාලෝචිත වර්ෂයේ හා පූර්ව වර්ෂයන්හි සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ණයගැති හා ණය හිමි පාලනය